# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 68 දරන
# අපරාධ නඩු විධාන සංග්‍රහය
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 නොවැම්බර් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 නොවැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 35 යි    තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 68 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 නොවැම්බර් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 49/79.

**ඇපදීම සම්බන්ධයෙන් උද්ගත වී ඇති ඇතැම් සැක නිරාකරණය කිරීමේ අරමුණ පෙරදැරි කර ගෙන, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 68 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 115 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1979 අංක 15 දරන පනතේ 115 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානවලට යටත් ව, දණ්ඩ නීති සංග්‍රහයේ 114 වන, 191 වන සහ 296 වන වගන්ති යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සිදුකර ඇති බවට හෝ සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ සිදුකර ඇතැයි සැක කරනු ලබන බවට හෝ සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇතැයි සැක කරනු ලබන බවට හෝ වූ චෝදනාවක ප්‍රතිඵලයක් වශයෙන්—

(අ) තමා විසින් ම අධිකරණයට භාර වූ ; නැතහොත්

(ආ) සිර භාරයට ගන්නා ලද

යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු විසින් ඇප පිට හෝ අන්‍යාකාරයකින් හෝ මුදා හරිනු නොලැබිය යුතු ය :

එසේ වුව ද නීතිපතිවරයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත මහාධිකරණය විසින් අන්‍යාකාරයෙන් විධාන කරතහොත් මිස, ඒ තැනැත්තා අධිකරණයට භාර වූ හෝ ඒ තැනැත්තා සිර භාරයට ගන්නා ලද හෝ දිනයෙහි සිට මාස තුනක කාලයක් ඉකුත් වීමට පෙර මහෙස්ත්‍රාත් අධිකරණයක නැතහොත් මහාධිකරණයෙහි ඔහුට විරුද්ධව නඩු කටයුතු ඉදිරිපත් කර නොමැති නම්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානවලට යටත්ව, ඒ තැනැත්තා ඇප පිට මුදා හරිනු ලැබිය යුතු ය :

2—ඒ 45318—14,800 (79/11)

එසේ ම තවදුරටත්, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන වල සඳහන් මාස තුනේ කාලය ඉකුත් වීමට පෙර හෝ පසුව හෝ මහාධිකරණය විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන වලට යටත් ව, ඒ තැනැත්තා විශේෂ අවස්ථානුගත කරුණු යටතේ ඇප පිට මුදා හරිනු ලැබිය හැකි ය.".

2 වන වගන්තිය අතීතයටත් බලපෑම.

3. මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරන ලද සංශෝධනය, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයෙහි සිට ක්‍රියාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.